# ප්‍රපංච වංකගිරිය

විශ්වාසය නොමැති ව දැනුමක් ගොඩනගාගත නොහැකි ය. සෑම දෙයකට ම හේතුවක් සොයන තැනැත්තා අවසානයේ දී දෙවියන් වහන්සේ හෝ බ්‍රහ්මන් හෝ අබියස නැවතෙයි. දෙවියන් වහන්සේ හෝ බ්‍රහ්මන් හෝ ඇති වූයේ කෙසේ ද යන ප්‍රශ්නයට හේතුවාදී ව පිළිතුරු දිය නොහැකි ය. හේතුවාදය හෙවත් බුද්ධිවාදය ගැන කියන කාන්ට් විද්වතා ප්‍රාග් අනුභූත (a priori) සංකල්ප ගැන සඳහන් කරයි. ඔහුට අනුව කාලය හා අවකාශය ප්‍රාග් අනුභූත සංකල්ප වෙයි. ඒවා අනුභූතියෙන් ඔබ්බෙහි වෙයි. ඒ සංකල්පවලට හේතුවක් නැත. ඒ තවත් සංකල්ප මගින් තේරුම්ගත හැකි නොවේ. බොහෝ දෙනා නොදැන සිටිය ද හේතුවාදය එක් තැනකින් ඔබ්බට හේතු නොසොයයි.

අප සාකච්ඡා කරමින් සිටියේ ප්‍රත්‍යක්ෂ ගැන ය. ප්‍රත්‍යක්ෂ ඉන්ද්‍රිය ගෝචර බව ද ඒ දැ ඒ මොහොතෙහි ම අත්විඳිය හැකි බව ද සඳහන් කෙළෙමු. සංසාරය අපට ප්‍රත්‍යක්ෂ නොවුණ ද සත්ත්වයන්ගේ පෙර ආත්මභව දැනගැනීමට හැකි අභිඥා ලද්දෝ සිටියහ. ඔවුන් දැනට නැතැයි කිසිවකුට කිව නොහැකි ය. එහෙත් අද අපි එතුමන්ගේ ප්‍රත්‍යක්ෂ විශ්වාස නොකරමු. අප අද විශ්වාස කරන්නේ බටහිර විද්‍යාඥයන්ගේ ප්‍රත්‍යක්ෂ ය. ඔවුන්ගේ ප්‍රත්‍යක්ෂ පමණක් නොව ප්‍රවාද ද අපි විශ්වාස කරමු. මේ ප්‍රවාද බටහිර විද්‍යාඥයන්ට වුව ද ප්‍රත්‍යක්ෂයෙන් දැනගත හැකි නොවේ. එහෙත් අපි ඒ සියල්ල විශ්වාස කරමු. එයට හේතුව අද ලෝකයේ ක්‍රියාත්මක වන සංස්කෘතික යටත්විජිතවාදය ය. ඒ බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයෙහි කොටසකි. ඒ යටත්විජිතවාදය විසින් බටහිර විද්‍යාඥයන්ට ආධිපත්‍යයක් ලබා දී ඇත.

මේ ලිපි පෙළෙහි මුල සිට ම කියා සිටි එක් කරුණක් වූයේ බටහිර විද්‍යා ප්‍රවාද ඊනියා යථාර්ථය හෝ සත්‍යය හෝ නොවන බව ය. නිව්ටෝනීය ගුරුත්වාකර්ෂණ ප්‍රවාදය ඒ සඳහා පැහැදිලි උදාහරණයක් ලෙස ඉදිරිපත් කෙරී ඇත. ගුරුත්වාකර්ණ බලයක් හෝ ගුරුත්වාකර්ෂණ ක්ෂෙත්‍රයක් හෝ යනුවෙන් දෙයක් නොමැති බවත් ගුරුත්වාකර්ෂණය යන්න නිව්ටන් පඬිවරයාගේ නිර්මාණයක් පමණක් බවත් කිහිප අවස්ථාවක දී ම ප්‍රකාශ කෙරී ඇත. ගුරුත්වාකර්ෂණය ඊනියා යථාර්ථය වී නම් පසු කලෙක පොල් හෝ ඇපල් හෝ පොළොවට වැටෙන්නේ ගුරුත්වාකර්ෂණයක් නිසා නොව අවකාශ කාලයෙහි වක්‍රතාව නිසා යැයි කීමට අයින්ස්ටයින් පඬිවරයාට නොහැකි වීමට තිබුණි. මෙයින් කියැවෙන්නේ පොල් පොළොවට වැටෙන්නේ අවකාශ කාලයෙහි වක්‍රතාවක් නිසා බව නොවේ. ඒ වක්‍රතාවය අයින්ස්ටයින් විද්වතාගේ නිර්මාණයක් පමණක් වන බැව් ද අපි අවධාරණය කෙළෙමු.

මේ ප්‍රවාද සියල්ල වියුක්ත ප්‍රවාද වෙයි. ඒ මනසින් තේරුම් ගත හැකි වුව ද පංචේන්ද්‍රියන්ට ගෝචර වන්නේ නොවේ. ගුරුත්වාකර්ෂණය ස්පර්ශ කළ අයකු ගැන දැනගන්නට නැත. එය වියුක්ත සංකල්පයක් පමණකි. ඒ සංකල්පය හා ගුරුත්වාකර්ක්‍ෂණ ප්‍රවාදය ඇසුරෙන් බටහිර විත්‍යාඥයන්ට ඇතැම් ඉන්ද්‍රිය ගෝචර සංසිද්ධි නැතහොත් ප්‍රත්‍යක්ෂ යම්තාක් දුරකට සංගත ව විස්තර කළ හැකි ය. එපමණකි. එහි එයට වැඩි දෙයක් නැත. සංගතභාවය ද ඇත්තේ සීමිත ක්ෂෙත්‍රයක පමණක් බව තේරුම් ගත යුතු ය. කලින් පෙන්වා දී ඇති පරිදි සූර්යයා වටේ ග්‍රහවස්තුවල චලිතය නිව්ටෝනීය ගුරුත්වාකර්ෂණ ප්‍රවාදය සමග සංගත නොවේ. ප්‍රවාදයෙන් කියැවෙන ආකාරයට ග්‍රහ වස්තු ඉලිප්සවල ගමන්කළ යුතු නමුත් එය එසේ නොසිදුවෙයි. ගල් කැටයක් උඩ දැමීම, රොකට්ටුවක් අභහරු ග්‍රහවස්තුවට වෙතට යැවීම ආදිය සම්බන්ධයෙන් ප්‍රවාදය සංගත වන නමුදු ග්‍රහවස්තුවල චලිතය සම්බන්ධයෙන් ගත්කල ප්‍රපංච සහ ප්‍රවාදය අතර සංගත බවක් නැත.

සිංහල බෞද්ධ සම්ප්‍රදායෙහි ප්‍රත්‍යක්ෂ ගැන යම් විශ්වාසයක් ඇති කර ගැණුන ද, ප්‍රවාද සම්බන්ධයෙන් එවැනි විශ්වාසයක් නැත. සීමිත වියුක්ත ප්‍රවාද කිහිපයක් පමණක් අපේ සම්ප්‍රදායෙහි දැක ගත හැකි ය. අභිධර්මයෙහි සඳහන් චිත්ත චෛතසික විභාගය සාමාන්‍ය සිංහල බෞද්ධයන් අතර එතරම් ජනප්‍රිය නැත. අද අභිධර්මය ජනප්‍රිය වන්නේ යම් මට්ටමකට බටහිර ක්‍රිස්තියානි අධ්‍යාපනයක් ලැබූවන් හා ඔවුන් අනුකරණය කරන්නන් අතර ය. සිංහල බෞද්ධයන් අතර ඇති වැදගත් ප්‍රවාදයක් නම් කර්ම ප්‍රවාදයයි. කර්මය ද වියුක්ත සංකල්පයක් පමණකි. ඒ වටා ගෙතී ඇත්තේ වියුක්ත ප්‍රවාද ය. ගුරත්වාකර්ෂණය මෙන් ම කර්මය ද ප්‍රපංච, සංසිද්ධි හෝ ප්‍රත්‍යක්ෂ නොවේ. කර්ම

© Prof. Nalin De Silva

විපාක ගැන අපි කතා කරමු. එහෙත් කර්මය, භවය මෙන් නොව, අභිඥා උපදවා ගත් අයගේ හෝ ප්‍රත්‍යක්‍ෂයක් නොවේ.

සිංහල බෞද්ධ සම්ප්‍රදායෙහි ප්‍රත්‍යක්‍ෂවලට වැඩි අවධාරණයක් කෙරෙයි. දැනුම ලබාගැනීමෙහි දී යොදාගන්නා එක ම මිනුම් දණ්ඩ ප්‍රත්‍යක්‍ෂය නොවුණ ද එයට වැඩි අවස්ථාවක් හා පිළිගැනීමක් ලැබෙයි. එහෙත් මේ අවධාරණය හා පිළිගැනීම බටහිර ඇතැම් දර්ශනවාද සමග පටලවාගත යුතු නොවේ. ප්‍රත්‍යක්‍ෂයට අමතර ව කලින් කියා ඇති පරිදි අනුමානය ද දැනුම ලබා ගැනීමේ ක්‍රමයක් ලෙස සිංහල බෞද්ධයෝ පිළිගනිති. කන්ද උඩ දුමක් ඇත්නම් කන්ද උඩ ගින්නක් වේ යන දැනුම ලබා ගන්නේ අනුමානයෙනි. කන්ද උඩ දුමක් ඇති බව පමණක් ප්‍රත්‍යක්‍ෂයෙන් දත හැකි ය. එහි ගින්නක් ඇති බව ඇසට නොපෙනෙයි. ඒ පිළිබඳ ප්‍රත්‍යක්‍ෂයක් නොවේ. එහෙත් කන්දෙහි ගින්නක් ඇති බව අපි අනුමාන කරමු. දුම මෙන් ම ගින්න ද ඇතැයි අපි කියමු.

ඇතැම් බොරු පණ්ඩිතයෝ ඉතිහාසයෙහි සිදු වූ දෑ ගැන අද අප දන්නේ කෙසේ දැයි අසති. අපට ඉතිහාසය ප්‍රත්‍යක්‍ෂයෙන් දැනගත නොහැකි ය. දුටුගැමුණු යනුවෙන් රජ කෙනකු සිටි බව අද අපට අත්විඳිය හැකි කරුණක් නොවේ. තුන්කල් පෙනෙන සෑම්වරයකුට එය ප්‍රත්‍යක්‍ෂයෙන් දැනගැනීමට හැකි වුව ද අපට ඒ කළ හැකි නොවේ. එසේ නම් අප දුටුගැමුණු රජු විසූ බව දැනගන්නේ කෙසේ ද? එයට ඇත්තේ එකම ක්‍රමයක් පමණකි. ඒ අනුමානය (inference) වෙයි. අනුමානය වෙනත් කරුණු සමග සංගත විය යුතු ය. අනුමානය යනු හුදු හිතළුවක් නොවේ. මහාවංශ කතා පුවත, වෙනත් වංශකතාවල සඳහන් කරුණු, සෙල්ලිපි ආදිය පමණක් නොව රුවන්මැලි සෑය ආදී මිනිසුන් විසින් තනවන ලද මානවකෘති ද (artifacts) එහි දී වැදගත් වෙයි. මේ සියල්ල සමග සංගත වන පුවතක් අපට දුටුගැමුණු රජු පිළිබඳ කතාවෙන් ලැබෙයි. දැනුම ලබාගැනීමේ දී අනුමානය ප්‍රතික්‍ෂෙප කරන්නාට තමන්ගේ දෙමව්පියන් කවුදැයි දැනගැනීමට ක්‍රමයක් නැත. අපට අපේ ඉපදීම යන සංසිද්ධිය ප්‍රත්‍යක්‍ෂයෙන් දැනගත නොහැකි ය. ප්‍රපංච හෙවත් සංසිද්ධි හෙවත් ප්‍රත්‍යක්‍ෂ පමණක් සත්‍ය යැයි ගැනීම ඇතැම් බොරු ප්‍රංචවේදීන්ගේ (phenomenolgists) බොරු පංඩිත වැඩකි.

බොරු ප්‍රපංචවේදීන්ට තම දෙමව්පියන් පමණක් නොව තමන් ගැන ද දැනගැනීමට නොහැකි ය. එයට හේතුව තම අතීතය තවදුරටත් ප්‍රපංචයක්, ප්‍රත්‍යක්‍ෂයක් නොවන නිසා ය. මා ඊයේ ආහාර අනුභව කළ බව මා දන්නේ කෙසේ ද? ඊයේ ආහාර ගැනීම යනු අද අත්විඳිය හැකි දෙයක් නොවේ. ඊයේ ආහාර ගත් බව අද අප දන්නේ අපට ඒ පිළිබඳ මතකයක් ඇති බැවිනි. කලින් ද සඳහන් කර ඇති පරිදි මතකය ගැන මෙනෙහි කිරීම ප්‍රත්‍යක්‍ෂයක් වුව ද යමක් පිළිබඳ මතකය ප්‍රත්‍යක්‍ෂයක් නොවේ. ඊයේ ආහාර ගැනීම මතකයෙන් හෝ දතහැකි වුව ද අවුරුදු පහකට පෙර පෙබරවාරි හතරවැනි දා, එසේත් නැත්නම් 1948 පෙබරවාරි හතරවැනි දා, එදා ජීවත් ව සිටියේ නම්, අප ආහාර අනුභව කළ බව අප දන්නේ කෙසේ ද? ඒ පිළිබඳ මතකයක් හෝ අපට ඇතැයි සිතිය නොහැකි ය. එවැනි කරුණක් ගැන අපට අනුමානයෙන් හෝ යමක් කිව නොහැකි ය. එහෙත් අසනීපයක් හෝ දිළිඳු බව හෝ උපවාසයක් වැනි වෙනත් කරුනක් නිසා එදා අප ආහාර නොගත්ත ද, අපට අනුමාන කළ හැක්කේ අප ඒ ආසන්න දිනවල නම් ආහාර අනුභව කර ඇති බව ය. එසේ නොවන්නට අපට අද ජීවතුන් අතර සිටිය හැකි නොවේ. එබැවින් අපට කිව හැක්කේ අවුරුදු පහකට පෙර හෝ අවුරුදු පණස්හයකට පෙර හෝ පෙබරවාරි හතරවැනිදාවක අප ආහාර අනුභව කිරීමට විශාල සම්භාවිතාවක් තිබෙන බව ය.

එහෙත් බොරු ප්‍රපංචවේදීන් පවසනු ඇත්තේ අපට ඒ බව සැකයකින් තොරව දැනගත නොහැකි බව ය. අපට ඊයේ ආහාර ගත් බව සැකයකින් තොරව දැනගැනීමට නොහැකිය යන්න බොරු ප්‍රපංචවේදීන්ගේ මතය වෙයි. එහෙත් මේ සැකය යන්නෙහි තේරුම කුමක් ද? ඉන් කියැවෙන්නේ යමක් පිළිබඳ විශ්වාසයක් නොමැති බව ය. යමක් ගැන නිශ්චිත ව නොදැනීම සැකයට හේතුවෙයි. එහෙත් ප්‍රශ්නය අප යමක් නිශ්චිත ව දැනගන්නේ කෙසේ ද යන්න ය. අපට යමක් පිළිබඳ ව සියයට සියයක් ම නිශ්චිත ව කුමක් කිව හැකි ද? අපට මේ මොහොතේ ප්‍රත්‍යක්‍ෂවන දෑ ගැන නිශ්චිත ප්‍රකාශයක් කළ හැකි ද?

මේ මොහොතෙහි සිදුවන දෑ නිශ්චිත ව දන්නා බව අප කියන්නේ අනුමානයෙන් බව බොරු ප්‍රපංචවේදීන්ට නොවැටහෙයි. මෙය එක්තරා ආකාරයකින් ගතහොත් වංකගිරියකි. මේ වංකගිරියෙන් නිදහස් විය හැක්කේ නිවන්

© Prof. Nalin De Silva

අවබෝධයෙන් පමණකි. ජාතක කතාවෙහි බෝසතාණන් වහන්සේගේ අවසන් ජාතකයෙහි වෙස්සන්තර රජු වංකගිරියට යන්නේ ම, නැතහොත් ජාතක කතාකරුවා එතුමන් වංකගිරියට යවන්නේ ම, වංකගිරියෙන් මේ සංසාර පටලැවිල්ල ම සංකේතවත් වන නිසා යැයි අපට නව අර්ථකථනයක් කළ හැකි ය. ඒ අර්ථකථනය හුදු හිතළුවක් නොව තවත් දෑ සමග සංගත වූවක් බව ඒ පිළිබඳ කල්පනා කිරීමෙන් තේරුම් ගත හැකි ය.

ප්‍රපංච යනු වංකගිරියකි. ඒ වංකගිරියෙහි ඊනියා ඇත්ත දැකීමට අප මෙහෙයවනු ලබන්නේ බටහිර දර්ශනය විසිනි. ප්‍රත්‍යක්ෂය පමණක් විශ්වසනීය වේ යන්න ඇතැම් බොරු ප්‍රපංචවේදීන්ට පමණක් සීමා වූ මතයක් නොවේ. බටහිර යථානුභූතවාදීහු ද එසේ සිතති. යථානුභූතවාදය (positivism) ද නිශ්චිත වූ ද සත්‍ය වූ ද දැනුමක් ගැන කතා කරයි. මේ නිශ්චිත දැනුම ලබාගත හැක්කේ අනුභූතියෙනි. එනම් පංචේන්ද්‍රිය ඇසුරෙනි. දැන් ප්‍රශ්නය වන්නේ පංචේන්ද්‍රිය ඇසුරෙන් අප ලබාගන්නා දැනුම ගැන අප විශ්වාසයක් තබන්නේ කෙසේ ද යන්න ය. අන් සියල්ල අවිශ්වාස කරමින් පංචේන්ද්‍රිය විශ්වාස කරන්නේ කිනම් පදනමකින් ද? පංචේන්ද්‍රියන් මගින් ලබාගත හැකි නිශ්චිත දැනුමක් වේ ද? මේ දැනුම ගැන පමණක් විශ්වාසය තබන්නේ ඇයි?

බටහිරයන්ට ඒ ප්‍රශ්නයට දිය හැකි පිළිතුරක් නැත. එවැනි දැනුමක් ගැන ඇතැයි ගැනීම උපකල්පනයක් පමණකි. එහෙත් ඒ උපකල්පනය පිටුපස ඇත්තේ තවත් උපකල්පනයකි. එනම් එලෙස පංචේන්ද්‍රිය ඇසුරෙන් ලබාගත හැකි දැනුමක් ඇත යන්න ය. වෙනත් අයුරකින් කිවහොත් අපට දැනුම ලබාගත හැකි ලෝකයක් වේය යන්න එහි පදනමෙහි වෙයි. මේ ලෝකය නිශ්චිත ව දැනගත හැකි බවත් එය පංචේන්ද්‍රිය ආශ්‍රයෙන් ප්‍රත්‍යක්ෂයෙන් ලබාගත හැකි බවත් එහි දී උපකල්පනය කෙරෙයි. එහෙත් බටහිරයෝ එය උපකල්පනයක් බව නොකියති. අපට දැනගත හැකි එවැනි ලෝකයක් ඇතැයි උපකල්පනය කරන බටහිරයෝ එයට යථාර්ථය යැයි කියති. මේ නම් වංකගිරියක් ම ය. එහෙත් ඒ වංකගිරිය ප්‍රපංච ලෝකයක් ඇසුරෙන් දැනගත හැකි යැයි බටහිරයෝ අපට කියා දෙති.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva